# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පරිවාස ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පරිවාස ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී II ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් සබරගමුව පළාතේ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. **2021 මාර්තු මාසයේ දී පමණ** විභාගය පැවැත්වීමට අපේක්ෂිතය ය.

01. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව : 05 (දිස්ත්‍රික් ජන අනුපාතය අනුව රත්නපුර - 03 හා කෑගල්ල - 02)

02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය : 2021-01-31

03. බඳවා ගැනීමේ සුදුසුකම් :

    විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජ විද්‍යාව, සමාජ වැඩ පිළිබඳ උපාධිය, අපරාධ විද්‍යාව, මානව විද්‍යාව, මනෝ විද්‍යාව යන විෂයයන්ගෙන් විශේෂ උපාධියක් ලබා තිබීම හෝ ඉහත විෂයයන්ගෙන් එකක් හෝ කිහිපයක් ඇතුළත්ව උපාධියක්, පංති සාමාර්ථයක් සහිතව ලබා තිබීම.

04. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 22 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

05. මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය :

    අංක 3/2016 හා 2016-02-25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව පරිවාස නිලධාරී II ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN 05-2016 වන අතර, මාසික වැටුප් පරිමාණය රු. 34,605-10+660-11X755-15X930 - රු. 63,460/- වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

06. විවෘත තරග විභාගයේ ඉහළම කුසලතාවය ලබා ගන්නා අයදුම්කරුවන් සඳහා පමණක් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත්වීම් ලබා දීම සිදු කෙරේ.

07. මෙම බඳවා ගැනීමේ සම්පූර්ණ නිවේදනය සහ ආදර්ශ අයදුම්පත්‍රය www.sg.gov.lk හා www.psc.sg.gov.lk වෙබ් අඩවිවල පළකර ඇත.

**පී.එස්.ආර්.එම්. විජයරාජ,**

**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කාර්යාලය,**
**සබරගමුව පළාත.**

2020-12-17